Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**විෂය - නාට්‍ය හා රංග කලාව**

**කාර්ය පත්‍රිකා - 15**

**12 ශ්‍රේණිය - තෙවන වාරය**

**සැකසුම - තරංගා D ගුණරත්න**

**නිපුණතාවය 6.1 : විවිධ අත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි.**
**පාඩම : අත්දැකීම් ඔස්සේ නිර්මාණකරණයට**

**ඉගැනුම් පල :**

- නිර්මාණශීලී ව විවිධ භූමිකාවලට අවතීර්ණ වෙයි.
- අත්දැකීම් මෙන් ම පරිකල්පන කුශලතා නිර්මාණ කාර්යය සඳහා යොදා ගනියි.
- අවධානයෙන් සහ අවබෝධයෙන් යුක්ත ව අවස්ථා නිර්මාණ සඳහා සක්‍රිය ව දායක වෙයි.
- චිත්ත ඒකාග්‍රතාව නිර්මාණ කරුවකු සතු විය යුතු බව අවබෝධ කර ගනියි.
- තාර්කික පදනමකින් යුතු ව භූමිකා නිරූපණය කරයි.
  සහයෝගයෙන් යුතු ව සාමූහික ව කටයුතු කරයි.

➢ ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්...

1) සමාජයේ ඔබ දකින,ඔබ අවට සිටින හා හිතවත් විවිධ චරිත හොඳින් අධ්‍යනය කරන්න.
2) ඔබ දැක ඇති විවිධ චරිත පිළිබඳ ස්මරණය කරන්න.එහිදී පහත කරුණු පිළිබඳ සැළකිළිමත් වන්න.
   - ❖ චරිතයේ වයස
   - ❖ ඇවිදින ස්වභාවය
   - ❖ සාමාන්‍යයෙන් අඳින පළඳින අයුරු
   - ❖ රුචි අරුචිකම්
   - ❖ කතා කරන ආකාරය
   - ❖ චරිතයට අදාළ පවුලේ විස්තර
3) ඔබ අධ්‍යනය කළ චරිත භාවිත කරමින් චරිත ලක්ෂණ ඉස්මතු වන සේ නාට්‍ය පිටපතක් රචනා කරන්න.
4) e-තක්සලාව,e-නැණ පියස,ගුරු ගෙදර,මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක භාවිතා කර වැඩිදුර අධ්‍යනයේ යෙදෙන්න.
5) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්,websites,ඉගෙනුම් ආධාරක :-
   I. e නැණ පියස 12 ශ්‍රේණිය නාට්‍ය හා රංග කලාව ගුරු මාර්ගෝපදේශය
   II. Youtube හි අදාළ නාට්‍යයන්හි video නරඹන්න.

➢ ආශ්‍රිත අතිරේක ග්‍රන්ථ -:

- ➢ හුණු වටයේ කථාව - හෙන්රි ජයසේන
- ➢ මනමේ - එදිරිවීර සරච්චන්ද්‍ර
- ➢ සුභ සහ යස - සයිමන් නවගත්තේගම
- ➢ කැළණි පාළම - ආර්.ආර්.සමරකෝන්
- ➢ නරි බෑණා - දයානන්ද ගුණවර්දන

- ඇගයීම

1.පහත දැක්වෙන සිදුවීම් පිළිබඳව මැනවින් පරිකල්පනය කොට නවතාවයකින් යුත් චරිත අවස්ථා නිර්මාණය කරන්න.

- ✓ සිංහයා මරා දැමූ සිංහබාහු
- ✓ බල්ලාගෙන් බේරී පැන ආ නරියා
- ✓ මයිකල් කුමාරයා රැගෙන පැන යන ගෘෂා
- ✓ මනමේ කුමරියට වනයේදී නරියා හමුවීම

2.යම් චරිතයක් අපූර්වත්ත්වයෙන් යුතුව නිර්මාණය කිරීමෙදී භාවිතා කළ හැකි උපක්‍රම මොනවාදැයි පෙළ ගස්වන්න.

- පසු ක්‍රියාකාරකම්

1. හේතුඵල සම්බන්ධතාව,තාර්කික බව,නාට්‍යයේ ගැටුම,භූමිකා,සංවාද,රංග විධාන,අනුශාංගික කලා ආදිය සහිතව රංගනයට අදාල නාට්‍ය පෙළක් ගොඩනඟන්න.
   - ඒ සඳහා කැමති නාට්‍ය ශෛලියක් තෝරා ගන්න.
   - රූපවාහිනිය,Youtube ඇසුරින් අවස්ථා සිද්දි නරඹා තම අත්දැකීම් ගොඩනගා ගන්න.